GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

16/09/2013

## මාධ්‍ය නිවේදනයයි.

පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනය පශ්චාත් උපාධි විභාග අඩු කිරීමට ගෙන ඇති තිරණයට අපි දැඩි විරෝධය පළ කරමු. මෙතෙක් වසරකට දෙවරක් පැවැත් වූ ළමා රෝග විශේෂඥ වෛද්‍ය විභාගය වසරකට වරක් පමණක් පැවැත්වීමට තිරණය කර ඇත.

ලංකාවේ ළමා රෝග විශේෂඥ වෛද්‍යවරු ඇත්තේ 200ක් පමණි. ලංකාවේ ජනගහනයට ඇති ඕස්ට්‍රේලියාවේ ළමා රෝග විශේෂඥ වෛද්‍යවරු 2800ක් ඇත. එහෙත් ඕස්ට්‍රේලියාවේ විශේෂඥ වෛද්‍යවරුන්ගේ එම සංඛ්‍යාවද මදි බව පවසයි.

කරුණු එසේ නමුත් ලංකාවේ පශ්චාත් උපාධි ආයතනය ගන්නා වූ මෙවැනි අදූරදර්ශී ක්‍රියා නිසා නැවතත් විශේෂඥ වෛද්‍යවරු අති දුර්ලභ වීමේ ප්‍රවනතාවයකට මුහුන දී ඇත.

පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ අධ්‍යක්ෂකවරයාට පසුගිය අගෝස්තු මාසයේ අප සංගමය ලියන ලද ලිපියට පිලිතුරු දීමටද උනන්දු වී නැත.

ඔහු පවසා ඇත්තේ එම ආයතනයේ කළමණාකරන කමිටුව ඔහුට බලපෑම් කරන බව පවසයි. මෙම තිරණය කළමණාකරන කමිටුව විසින් ඔහුට දෙන ලද නියෝගයක් බැවින් ඔහු අසරණ වී ඇතැයි පවසා ඇත.

එබැවින් මෙම තිරණාත්මක මොහොතේ සෞඛ්‍ය ලේකම්වරයා මැදිහත් වී ළමා රෝග විශේෂඥ පශ්චාත් උපාධි අවසන් විභාගය නැවත ලබා දෙන ලෙස ඉල්ලා සිටිමු.

ස්තුතියි

වෛද්‍ය සමන් අබේවර්ධන
ලේකම්

වැඩිදුර විස්තර - වෛද්‍ය නවීන් සොයිසා - 0718582444
වෛද්‍ය රසික පෙරේරා - 0773673987